# විවිධ ගී

## 461 සුරංගනාවියක් වගේ

සුරංගනාවියක් වගේ පියාසලා අහස් තලේ
ඉගිල්ලෙන්ට කුරුල්ලන්ට තටු සලසන ස්වාමිනේ
සුදෝ සුදු වතින් සැරසී නව දිවියට පා තබනා
අප ආදර මනාලියට දෙන්න ඔබෙ වරම්
සමිඳෙ දෙන්න සැම වරම්

ඔබ යන මඟ දිගටම සුදු මල් පිබිදේවා
ඔබ ඉදිරියෙ විසකටු මල් බවට හැරේවා
ඔබේ තිවස නැවුම් මලක සුවඳින් නහවා
සමිඳෝ ඔබගේ හද සතුටින් පුරවත්වා

සමිඳුන්ගේ බලවත් සුරතේ ඔබ වටලා
සැම නපුරෙන් ගලවා ඔබ තිති සුරකීවා
දෙනෙතේ කඳුලැලි දිලිසෙන විට හද පහරා
සමිඳෝ පිසදා කඳුලැලි ඔබ සනසත්වා